# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2470/12 - 2026 ජනවාරි මස 05 වැනි සඳුදා - 2026.01.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. - බී .1/2015

**1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත**

පාලක සභාවේ නිර්දේශය මත, 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනතේ 25 වන වගන්තියේ (ඇ) ඡේදය සමග කියවිය යුතු එකී පනතේ 40 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කේ. ඩී. ලාල්කාන්ත**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2025 අංක 1 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික (අපකීර්තිමත් හැසිරීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වන කොටස**

***අපකීර්තිමත් හැසිරීම***

2. මෙහි පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්, මේ නියෝගවල කාර්ය සඳහා අපකීර්තිමත් හැසිරීමක් විය යුතු ය.


1A - PG 7452 — 403 (2026/01)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## II වන කොටස

### *පරීක්ෂණ මූල මණ්ඩල පත්කිරීමේ ආකාරය සහ කාර්යපටිපාටිය*

3. පාලක සභාව විසින්, ස්වකීය මෙහෙයවීම මත හෝ යම් තැනැත්තකු විසින් එය වෙත කරනු ලබන පැමිණිල්ලක් ලැබුණු විට යම් පශු වෛද්‍යවරයකුගේ හෝ පශු වෛද්‍ය වෘත්තිකයකුගේ අපකීර්තිමත් හැසිරීම සම්බන්ධයෙන් වන පැමිණිල්ලක් පිළිබඳ විමර්ශනය කරනු ලැබිය හැකි ය.

4. 3 වන නියෝගයේ සඳහන් පැමිණිල්ල මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු අතර, එය පාලක සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. (1) පාලක සභාව විසින්, 4 වන නියෝගය යටතේ පැමිණිල්ලක් ලැබුණු විට-

(අ) ඊළඟ පාලක සභා රැස්වීමේදී හෝ තත් කාර්යය සඳහා කැඳවන ලද පාලක සභාවේ විශේෂ රැස්වීමක දී එකී පැමිණිල්ල සභාගත කිරීම; සහ

(ආ) ස්වකීය අභිමතය පරිදි, සාමාජිකයන් තිදෙනෙකුගෙන් හෝ පස්දෙනෙකුගෙන් සමන්විත වන පරීක්ෂණ මූල මණ්ඩලයක් පත්කිරීම.

(2) පාලක සභාව විසින් කරනු ලැබිය යුතු ය.

(අ) සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වන පරීක්ෂණ මූල මණ්ඩලයක් පත්කිරීමට තීරණය කරනු ලැබූ අවස්ථාවක, යටත් පිරිසෙයින්, ඉන් එක් සාමාජිකයකුවත් පාලක සභාවේ සාමාජිකයකු ද;

(ආ) සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත වන පරීක්ෂණ මූල මණ්ඩලයක් පත්කිරීමට තීරණය කරනු ලැබූ අවස්ථාවක, යටත් පිරිසෙයින්, ඉන් සාමාජිකයන් දෙදෙනකුවත් පාලක සභාවේ සාමාජිකයන් ද;

විය යුතු අතර, අනෙකුත් සාමාජිකයන් පශු වෛද්‍යවරයකු හෝ පශු වෛද්‍ය වෘත්තිකයකු ලෙස අවම වශයෙන් වසර දහයක පළපුරුද්දක් සහිත පශු වෛද්‍යවරයන් හෝ පශු වෛද්‍ය වෘත්තිකයන් විය යුතු ය.

එසේ වුවද, පාලක සභාව විසින් උචිත යයි සලකනු ලබන අවස්ථාවක, එවැනි යම් පශු වෛද්‍යවරයකු හෝ පශු වෛද්‍ය වෘත්තිකයකු වෙනුවට. එය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් නිශ්චිත විෂය ක්ෂේත්‍රයක පළපුරුද්ද හෝ දැනුම ඇති වෙනත් යම් තැනැත්තකු පරීක්ෂණ මූල මණ්ඩලයට පත් කරනු ලැබිය හැකිය.

## III වන කොටස

### පාලක සභාවේ පරීක්ෂණ සහ තීරණ

6. 5 වන නියෝගය යටතේ පත් කරනු ලබන සෑම පරීක්ෂණ මූල මණ්ඩලයක් විසින් ම -

(අ) අපකීර්තිමත් හැසිරීම සිදු කළායැයි චෝදනා ලබන (මෙහි මින්මතු “පශු වෛද්‍යවරයා හෝ පශු වෛද්‍ය වෘත්තිකයා” යනුවෙන් සඳහන් කරනු ලබන) පශු වෛද්‍යවරයාගෙන් හෝ පශු වෛද්‍ය වෘත්තිකයාගෙන් හෝ පරීක්ෂණයට අදාළ වෙනත් යම් තැනැත්තකුගෙන් හෝ තොරතුරු හෝ ලේඛන ලබාගැනීම හෝ කැඳවීම කරනු ලැබිය යුතු ය;

(ආ) එය ඉදිරියෙහි පෙනී සිට, 9 වන නියෝගය යටතේ යම් ක්‍රියාමාර්ගයක් නොගත යුත්තේ මන්ද යන්න සම්බන්ධයෙන් හේතු දක්වන ලෙස එකී පශු වෛද්‍යවරයාට හෝ පශු වෛද්‍ය වෘත්තිකයාට දැනුම් දෙනු ලැබිය යුතු ය;

(ඇ) යුක්තිසහගත දැන්වීමක් කිරීමෙන් පසුව සහ යුක්තිසහගත වේලාවන්හිදී, පාලක සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව, එකී අපකීර්තිමත් හැසිරීම සිදුව ඇති හෝ සිදුව ඇතැයි විශ්වාස කරනු ලබන යම් පරිශ්‍රයක් පිළිබඳ පරීක්ෂණ සිදු කරනු ලැබිය හැකි ය.

7. (1) 5 වන නියෝගය යටතේ පත් කරන ලද සෑම පරීක්ෂණ මූල මණ්ඩලයක් විසින් ම, අදාළ පරීක්ෂණ මූල මණ්ඩලය විසින් ලිඛිතව ඉදිරිපත් කරන ලද වලංගු හේතු මත පාලක සභාව විසින් කාලය දීර්ඝ කිරීමක් ප්‍රදානය කර ඇත්නම් මිස, එය පත් කිරීමේ දින සිට මාස තුනක් ඇතුළත එහි විමර්ශන සම්බන්ධයෙන් වන සියලු විභාග සහ පරීක්ෂණ අවසන් කරනු ලැබිය යුතු ය.

(2) එක් එක් පරීක්ෂණ මූල මණ්ඩලයේ තීරණ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතුය.

(3) එක් එක් පරීක්ෂණ මූල මණ්ඩලය විසින් අනුමත කරන ලද අවසාන වාර්තාව, විභාග සහ පරීක්ෂණ අවසන් කිරීමෙන් පසු මාසයක් ඇතුළත පාලක සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

8. සෑම පරීක්ෂණ මූල මණ්ඩලයක් විසින් ම -

(අ) පශු වෛද්‍යවරයා හෝ පශු වෛද්‍ය වෘත්තිකයා එකී අපකීර්තිමත් හැසිරීම සම්බන්ධයෙන් වරදකරු වන්නේ ද නැද්ද යන්න;

(ආ) වරදකරු බවට තීරණය කරනු ලැබුවහොත්, පශු වෛද්‍යවරයා හෝ පශු වෛද්‍ය වෘත්තිකයා මත පනවනු ලැබිය යුතු දණ්ඩනය;

(ඇ) එකී අපකීර්තිමත් හැසිරීම නැවත සිදුවීම වැළැක්වීම සඳහා ගත යුතු යම් පියවර,

සම්බන්ධයෙන් වන නිර්දේශයක් එහි වාර්තාවෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය.

9. (1) පනතේ 18 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව පවත්වනු ලබන පාලක සභාවේ යම් රැස්වීමකදී සහ අදාළ පරීක්ෂණ මූල මණ්ඩලයේ නිර්දේශය සැලකිල්ලට ගැනීමෙන් පසුව සහ ඒ පශු වෛද්‍යවරයා හෝ පශු වෛද්‍ය වෘත්තිකයා එකී අපකීර්තිමත් හැසිරීම සම්බන්ධයෙන් වරදකරු වන බවට පාලක සභාව විසින් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, පාලක සභාව විසින් -

(අ) ඒ පශු වෛද්‍යවරයාට හෝ පශු වෛද්‍ය වෘත්තිකයාට පාලක සභාව ඉදිරියෙහි පෙනී සිටින ලෙස නියෝග කර, වාචික අවවාදයක් නිකුත් කිරීම;

(ආ) ලිඛිතව අවවාදයක් නිකුත් කිරීම; හෝ

(ඇ) පහත දැක්වෙන එකක් හෝ වැඩි සංඛ්‍යාවක් පනවනු ලැබීම :-

(i) පාලක සභාව විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවකට ඒ පශු වෛද්‍යවරයාගේ හෝ පශු වෛද්‍ය වෘත්තිකයාගේ ලියාපදිංචිය අත්හිටුවීම; හෝ

(ii) පශු වෛද්‍යවරයාට හෝ පශු වෛද්‍ය වෘත්තිකයාගේ නම නාම ලේඛනයෙන් ඉවත් කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) (1) වන අනුනියෝගය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙරාතුව, පාලක සභාව විසින්, එකී අපකීර්තිමත් හැසිරීමේ ස්වභාවය සහ බරපතළකම සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

10. මේ නියෝග යටතේ පරීක්ෂණ පැවැත්වීමේ දී වැය වන සියලු වියදම් පාලක සභාව විසින් දරනු ලැබිය යුතු ය;

එසේ වුවද, පාලක සභාව විසින්, යුක්තිසහගත සහ අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, ඒ පශු වෛද්‍යවරයා හෝ පශු වෛද්‍ය වෘත්තිකයා වරදකරු බවට තීරණය කරනු ලැබුවහොත්, 9 වන නියෝගය යටතේ ඔහුට එරෙහිව ගන්නා ලද ක්‍රියාමාර්ගයට අමතරව, සම්පූර්ණ පිරිවැය හෝ ඉන් යම් කොටසක් හෝ ඒ පශු වෛද්‍යවරයාගෙන් හෝ පශු වෛද්‍ය වෘත්තිකයාගෙන් අය කරගනු ලැබිය හැකිය.

11. මේ නියෝගවල කාර්ය සඳහා -

“පනත” යන්නෙන්, 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත අදහස් වේ;

“පාලක සභාව” යන්නට, 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනතින් ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතුය;

''නාම ලේඛනය'' යන්නෙන්, 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන නාම ලේඛනය අදහස් වේ;

''පශු වෛද්‍ය වෘත්තිකයා'' යන්නෙන්, 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත යටතේ පශු වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් ලියාපදිංචි වූ යම් තැනැත්තකු අදහස් වේ; සහ

''පශු වෛද්‍යවරයා'' යන්නෙන්,1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත යටතේ පශු වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි වූ යම් තැනැත්තකු අදහස් වේ.

*පළමුවන උපලේඛනය*

(2 වන නියෝගය)

පශු වෛද්‍යවරයකුගේ හෝ පශු වෛද්‍ය වෘත්තිකයකුගේ අපකීර්තිමත් හැසිරීම

(අ) වෘත්තිය තුළ අනුප්‍රමිත නිපුණතා භාවිතා කිරීම සහ අනුප්‍රමිත සේවාවක් සැපයීම;

(ආ) පශු වෛද්‍යවරයකු හෝ පශු වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් ස්වකීය තත්ත්වයට නොගැළපෙන ලෙස කටයුතු කිරීම;

(ඇ) පශු වෛද්‍යවරුන්ගේ සහ පශු වෛද්‍ය වෘත්තිකයන්ගේ වෘත්තිය හෝ පාලක සභාවේ කීර්තිනාමය අපකීර්තියට පත්කිරීම හෝ අපකීර්තියට පත්කිරීමට තැත් කිරීම;

(ඈ) වෙනත් යම් පශු වෛද්‍යවරයෙකුගේ හෝ පශු වෛද්‍ය වෘත්තිකයකුගේ වෘත්තීය ගරුත්වය හෝ නිපුණතාව අපකීර්තියට පත්කිරීම හෝ අපකීර්තියට පත් කිරීමට තැත් කිරීම;

(ඉ) අසම්පූර්ණ, අයෝග්‍ය හෝ වැරදි සහගත තාක්ෂණික උපදෙස් හෝ තොරතුරු සැපයීම;

(ඊ) පාලක සභාවේ මතය අනුව, යම් සත්වයකුට සහන සැලසීමේදී අනවශ්‍ය වේදනාවක් හෝ ප්‍රමාදයක් ඇති කළ හැකි යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්;

(උ) පනතේ හෝ මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරමින් යම් කාර්යපටිපාටියක් හෝ පිළිවෙතක් ඉටුකිරීමට වෙනත් යම් තැනැත්තෙකුට ඉඩ ලබාදීම හෝ අවසරදීම;සහ

(ඌ) ස්වකීය වෘත්තීය කටයුතු ඉටුකිරීමේදී දැඩි නොසැලකිල්ලක් ප්‍රදර්ශනය කිරීම.

*දෙවන උපලේඛනය*

(4 වන නියෝගය)

පශු වෛද්‍යවරයකුගේ හෝ පශු වෛද්‍ය වෘත්තිකයකුගේ අපකීර්තිමත් හැසිරීම පිළිබඳ වන පැමිණිල්ල

1. පැමිණිලිකරු පිළිබඳ සාමාන්‍ය තොරතුරු;

| | | |
|---|---|---|
| (අ) | සම්පූර්ණ නම/ මුලකුරු සමග නම | |
| (ආ) | ලිපිනය | |
| (ඇ) | දුරකථන අංකය | |
| (ඈ) | විද්‍යුත් තැපැල් ලිපිනය | |

2. පැමිණිල්ල ඉදිරිපත් කරනු ලබන්නේ කවුරුන් හට එරෙහිවද යන්න;

| | | |
|---|---|---|
| (අ) | සම්පූර්ණ නම/ මුලකුරු සමග නම | |
| (ආ) | ලිපිනය | |

3. පැමිණිල්ල;

| | | |
|---|---|---|
| (අ) | සිද්ධිය/ සිද්ධි සිදු වූ දිනය/ දින | |
| (ආ) | පැමිණිල්ල සංක්ෂිප්තව<br>(අවශ්‍යනම්, ඇමුණුමක් වශයෙන්) | |
| (ඇ) | සාක්ෂි කිසිවක් ඇත්නම්, එම සාක්ෂි<br>(අවශ්‍ය නම්, ඇමුණුමක් වශයෙන්) | |
| (ඈ) | වෙනත් සාක්ෂිකරුවන් සිටීනම්, එම සාක්ෂිකරුවන්<br>නම/නම්<br>ලිපිනය/ලිපින | |

...................................... .........................

පැමිණිලිකරුගේ අත්සන දිනය

*EOG 01 - 0037*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.